# ටීකා සාහිත්‍යය

කථිකාචාර්ය, පූජ්‍ය විජිතපුර ගුණරතන හිමි

පාලි ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදනය වූයේ බුද්ධ වචනය පැහැදිලි කිරීම සඳහා ය. සූත්‍ර-විනය-අභිධර්ම යනුවෙන් දැක්වෙන එම ත්‍රිපිටකය තුළ බුද්ධ දේශනා මෙන්ම ශ්‍රාවක භාෂිත ද අන්තර්ගත වේ. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව සම්පාදිත සූත්‍ර ද ත්‍රිපිටකය තුළ ඇත. අභිධර්ම පිටකයට අයත් කථාවත්ථුප්පකරණය තෘතීය ධර්ම සංගීතිය අවසානයේදී සම්පාදනය කරණ ලද බැවින් එය බුදුගොස් හිමියන්ගේ පැහැදිලි කිරීමට අනුව බුදුරදුන් තැබූ න්‍යාය අනුව පිහිටා මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ විසින් සම්පාදිත බැවින් එය ද ත්‍රිපිටකයට ඇතුළත් විය.

මෙසේ ක්‍රමයෙන් ත්‍රිපිටකය ග්‍රන්ථ **31** ක් ලෙස සම්පාදනය වීමෙන් අනතුරුව ඒවායෙහි අන්තර්ගත දුරවබෝධ පද සහ සංකල්ප විවරණය කරමින් බුද්ධඝෝෂ හිමියන් විසින් පෙළ ග්‍රන්ථවල අර්ථ ව්‍යාඛ්‍යාන සපයන ලදී. ඒවා අට්ඨකථා යන නාමයෙන් හඳුන්වයි.

පසුකාලයේ ප්‍රවීණ විද්වත් තෙරවරුන් විසින් ඉතිරි ග්‍රන්ථවලටත් අර්ථ ව්‍යාඛ්‍යාන ලිවීමෙන් පසු ඒවායෙහි තවදුරටත් විස්තර කළ යුතු පද හා සංකල්ප ඇති බැවින් පොළොන්නරු යුගයේ විසූ විද්වත් තෙරවරුන්ට සිදු වූයේ එබඳු දුරවබෝධ පද පැහැදිලි කර දීමය. එබැවින් උන්වහන්සේලා ග්‍රන්ථ රාශියක් සැපයූහ. ඒවා හඳුන්වනුයේ ටීකා නමිනි. ටීකාචාර්යවරුන් අතර පොළොන්නරු යුගයේ විසූ **ශාරිපුත්‍ර** තෙරුන්ට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. ඉන් අනතුරුව ටීකා ද ප්‍රමාණවත් නොවීය. තවදුරටත් ගැටලු පද විස්තර කරමින් අනුටීකා රැසක් විද්වත් තෙරවරුන් විසින් සම්පාදිතව ඇති අතර ඒවා ද ප්‍රමාණවත් නොවී **ටිප්පණි, ග්‍රන්ථිපද, සන්න** ආදි ග්‍රන්ථ රාශියක් සම්පාදනයට සිදු වූයේ ගැඹුරු බුදුදහම පාඨක ජනයාට පහසුවෙන් අවබෝධ කරවීමට ය.

බුදුදහම සහ පෙළ සාහිත්‍යය ඇසුරෙන් ප්‍රකරණ ප්‍රකරණ ග්‍රන්ථ රැසක් පාලි භාෂාවෙන් සම්පාදනය වූයේ ඒ ඒ යුගවල විසූ තෙරවරුන් විසිනි. මෙසේ යුග ගණනාවකදී ලිය වී ඇති පාලි ටීකා හා ප්‍රකරණ ග්‍රන්ථ පිළිබඳ අධ්‍යයනයක් කරණු ලැබේ. මුලදී ටීකා ග්‍රන්ථ අටුවාවලට පමණක් ලියැවුණු අතර, ටීකා සාහිත්‍යය විවිධ විෂයන් ඔස්සේ පැතිර යාමෙන් පුළුල් ටීකා සාහිත්‍යයක් බිහි වී ඇත. එනම්, **ඡන්දොලඞ්කාර, ව්‍යාකරණ** වැනි ග්‍රන්ථවලටත් ටීකා සැපයීමෙන් ටීකා ග්‍රන්ථ තත්කාලීන බෞද්ධ භික්ෂූන්ගේ භාෂාන්තර හා සමයාන්තර විශාරදත්වය මැනවින් ප්‍රකට කරයි.

පාලි අට්ඨකථාවල එන දුරවබෝධ වචන සහ සංකල්ප පැහැදිලි කිරීමේ අරමුණින් ලක්දිව වැඩ විසූ මහතෙරවරුන් විසින් පාලි ටීකා ග්‍රන්ථ සම්පාදනය කිරීම ආරම්භ කොට ඇත. ටීකා කාරක ආචාර්යවරයන් අතුරෙන් **භදන්ත ආනන්ද, ධම්මපාල, ශාරිපුත්‍ර** යන මහතෙරුන් වහන්සේලා තුන් නම ප්‍රධාන වෙති. 'ටීකා' යන වචනයට දිය හැකි අර්ථකථනය නම් '**අත්ථවණ්ණනා**' යන්නයි. එනම්, අර්ථ කථාවන්හි සඳහන් වන අදහස් නිවැරදි ලෙස අවබෝධ කර ගැනීම පිණිස තවදුරටත් පැහැදිලි කිරීම අවශ්‍ය වන කොටස්වලට කරණ ලද විස්තරාත්මක විවරණයන් ය. ඇතැම් විට අර්ථකථාවල එන සාකච්ඡාවන් පිළිබඳ නිදර්ශන කථා ආදි අතිරේක ප්‍රවෘත්ති පමණක් ටීකාවන්හි විස්තර වේ. ටීකාවල එන දුරවබෝධ ස්ථාන විවරණය කළ ග්‍රන්ථ හඳුන්වනු ලබන්නේ '**ටිප්පණි**' ග්‍රන්ථ යනුවෙනි.

අට්ඨකථාවන්හි විස්තර කෙරෙණ ඇතැම් ධර්මකරුණු තේරුම්ගත නොහැකි වීම නිසා විවාදාපන්න වූ එබඳු ගැටමුසු තැන් පැහැදිලි කිරීම සඳහා ටීකා ග්‍රන්ථකරණය ආරම්භ වී ඇත. පාලි ටීකා සාහිත්‍යයෙහි ප්‍රභවය ලක්දිවදී සිදු වී තිබීම මෙහිලා වැදගත් කරුණක් ලෙස සැලකිය හැකිය. පාලි අට්ඨකථා ග්‍රන්ථවලට පමණක් නොව ඇතැම් ප්‍රකරණ ග්‍රන්ථවලට පවා පශ්චාත්කාලීන කතුවරුන් විසින් ටීකා ග්‍රන්ථ ලිවීම නිසා පාලි ටීකා සාහිත්‍යය ක්‍රමයෙන් පුළුල් වෙමින් විකාශයට පත් වී ඇත. ක්‍රි.ව.5 වන සියවසේදී පමණ රචිත පාලි මහාවංසයේ එන ඇතැම් ඓතිහාසික තොරතුරු පිළිබඳ වැඩිපුර විස්තර අනාවරණය කරණු පිණිස ඊට සමකාලීන යුගය ලියැවුණු '**වංසත්ථප්පකාසිනී**' නමැති මහාවංසටීකාව ඊට නිදසුනක් ලෙස දැක්විය හැකිය. මහින්දාගමනයෙන් පසු පාලි අට්ඨකථා රචනා වූ යුගයේදීම ප්‍රභවය වී ඇති පාලි ටීකා ග්‍රන්ථකරණය වර්තමානය දක්වාම වර්ධනය වෙමින් පවතී. මෑතකදී රචනා වූ වැදගත්ම ටීකා ග්‍රන්ථය නම් විද්‍යෝදය පිරිවෙණෙහි ආදිකර්තෘ වූ බොධිසත්ත්වගුණොපෙත හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගල නාහිමියන් විසින් 'බාලාවතාරය' නම් පාලි ව්‍යාකරණය සඳහා සැපයූ '**සුබොධිනී ටීකා**' නම් බාලාවතාර ටීකාව යි.

පාලි ටීකා ග්‍රන්ථ අතුරෙන් ප්‍රථමයෙන්ම ටීකාවක් ලියන ලද්දේ අභිධම්ම පිටකය සඳහා බව පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියෝ සිය පාලි සාහිත්‍යය ග්‍රන්ථයේදී සඳහන් කරති. **මහාවිහාරවාසී භදන්ත ආනන්ද** තෙරුන් වහන්සේ විසින් ලියන ලද එම ටීකා ග්‍රන්ථය හඳුන්වනු ලබන්නේ '**අභිධම්මමූලටීකා**' යන නමිනි. මේ ආනන්ද තෙරුන් වහන්සේ අත්‍ථකථාචාර්‍ය ධම්මපාල මහතෙරුන් වහන්සේටත් පෙර විසූ කෙනෙකි. එම මූලටීකා ග්‍රන්ථයට අනුටීකාවක් ලියන ලද්දේද ධම්මපාලාචාර්‍යතුමා විසින් යැයි බුරුම සාසනවංසයෙහි සඳහන් වේ. පාලි ටීකා රචකයන් අතුරින් **බදිරතිත්‍ථවාසී භදන්තාචරිය ධම්මපාල** මහතෙරුන්ට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. 'දාඨානාග' නම් තෙරුන් වහන්සේගේ ආරාධනාව පරිදි '**පරමත්‍ථමඤ්ජුසා**' නමින් හැඳින්වෙන '**විසුද්ධිමග්ග ටීකාව**' රචනා කරණ ලද්දේ උන්වහන්සේ විසිනි. මහානාම රාජ්‍ය සමයෙහි දඹදිව සිට ලඞ්කාවට වැඩම කළ ආචාර්‍ය බුද්ධඝෝෂ මාහිමියන් වහන්සේ විසින් අනුරාධපුර මහාවිහාරවාසී භික්‍ෂූන් වහන්සේලාගේ නිර්දේශය අනුව ප්‍රථමයෙන්ම සම්පාදිත ත්‍රිපිටකයටම පොදු සාධාරණ අට්ඨකථාවක් වූ විසුද්ධිමග්ග නමැති ග්‍රන්ථයෙහි දුරවබෝධ පදයන්ගේ අත්‍ථවිවරණය කිරීම සඳහා එම ටීකාව ලියන ලද බව සඳහන් වේ. මෙම විසුද්ධිමග්ගය අට්ඨකථාවක් නොව ප්‍රකරණ ග්‍රන්ථයකැ'යි සමහරුන් පවසන නමුත්, අට්ඨකථාගත ඇතැම් තොරතුරු අනුව සූත්‍ර-විනය-අභිධම්ම යන ත්‍රිපිටකයටම පොදු අට්ඨකථාවක් ලෙස පිළිගැනීම වඩාත් සුදුසු ය. එය සුමඞ්ගලවිලාසිනී ආදි සෙසු අට්ඨකථා මෙන් දීඝනිකායාදි එක් ග්‍රන්ථයක් වෙන් කොට ඒ ග්‍රන්ථයට පමණක් ලිඛිත අට්ඨකථාවක් නොවේ.

සංයුත්තනිකායෙහි අන්තර්ගත "**සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො...**" ආදි ගාථාව මාතෘකාවට ගෙණ ඇතත්, එය දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුත්තනිකාය, අඞ්ගුත්තරනිකාය යන සතරටම මධ්‍යයෙහි පිහිටා ලියන ලද්දකි. එම නිසා 'විසුද්ධිමාර්ගය' අට්ඨකථාවක් ලෙස සැලකීම යුක්ති යුක්ත වේ. විසුද්ධිමාර්ගය මෙන්ම විසුද්ධිමාර්ග ටීකාව ද මහාවිහාරවාසී භික්‍ෂූන් වහන්සේලාගේ දහම්නය අනුවම එය නො ඉක්මවා රචිත බව "**මහාවිහාරවාසීනං සමයං අවිලොමයං**" යනුවෙන් එම ටීකාව ආරම්භයේ ම සඳහන් කර තිබීමෙන් පෙනී යයි.

එකම අට්ඨකථාව සඳහා ඇතැම් විට ටීකා ග්‍රන්ථ දෙක තුණක් ම සම්පාදිත බව දක්නට ලැබේ. නිදසුනක් වශයෙන් බුද්ධඝෝෂ මාහිමියන් විසින් රචිත '**සමන්තපාසාදිකා**' නමැති

විනයට්ඨකථාවෙහි දුරවබෝධ තැන් ප්‍රකට කිරීම සඳහා විනය ටීකා ග්‍රන්ථ තුණක්ම රචනා කර තිබීම දැක්විය හැකිය. එනම්,

i. **වජිරබුද්ධි ටීකාව** - **වජිරබුද්ධි ථෙර**
ii. **සාරත්ථදීපනී ටීකාව** - **සාරිපුත්ත ථෙර**
iii. **විමතිවිනොදනී ටීකාව** - **චොළිය කස්සප ථෙර**

ප්‍රථමයෙන් ම ලිඛිත විනය ටීකාව '**වජිරබුද්ධි**' ටීකාවයි. එහි ඇතැම් අදහස් සාරත්ථදීපනියෙහි විවේචනය කර ඇති අතර, සාරත්ථදීපනියෙහි එන අදහස් විමතිවිනොදනියෙහි විවේචනය බඳුන් වේ.

පාලි අට්ඨකථාවන්ගේ ප්‍රභවය දඹදිවදී සිදු වූ නමුත්, පාලි ටීකාවන්ගේ සම්භවය සම්පූර්ණයෙන්ම සිදු වී ඇත්තේ, ලංකාවේදී ය. ටීකා ග්‍රන්ථ සංග්‍රහ කොට රචනා කිරීම ආරම්භ කරණ ලද්දේ ද, විකාශයට පත් කරණ ලද්දේ ද, පොළොන්නරු යුගයේ විසූ ශ්‍රී ලාංකික පඬිවරුන් විසිනි. ත්‍රිපිටකය සහ අට්ඨකථාවන් පිළිබඳ ටීකා ග්‍රන්ථ ලියන ලද්දේ දිඹුලාගල විසූ මහතෙරුන් වහන්සේලා මූලාසනයේ තබා පොළොන්නරුවෙහි රජකළ I වැනි **මහාපරාක්‍රමබාහු** රජුගේ අනුග්‍රහයෙන් පවත්වන ලද සංඝ සම්මේලනයට අනතුරුව බව මහාචාර්ය, මලලසේකර මහතා '**සද්ධම්මසංගහ**' ග්‍රන්ථයේ පාඨයක් ගෙණ හැර දක්වමින් පෙන්වා දෙයි. පාලි ටීකාවන් රචනා කිරීමට අවස්ථාව උදා වූයේ කෙසේද? යන්න පිළිබඳව එහි මෙසේ සඳහන් වේ. **"ලංකාවේ ත්‍රෛනිකායික භික්ෂු සංඝයා අතර සමගිය ඇති කරවා ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා විහාර හා විද්‍යාස්ථාන පිහිටවූ පසු ජේතවන මහා විහාරයෙහි වැඩ විසූ දහස් සංඛ්‍යාත භික්ෂු සංඝයාට නායක වූ මහාකාශ්‍යප තෙරණුවෝ ඔවුන් රැස් කරවා මෙසේ කීහ; 'ත්‍රිපිටක අටුවාවන්හි පැරණි ඇදුරන් විසින් සංග්‍රහ කර ඇති අට්ඨකථා සියල්ලම මෙකල දේශාන්තරවාසී භික්ෂූන්ට ප්‍රයෝජනවත් නොවේ. එයින් බොහෝමයක් සිංහල බසින් රචිත ය. ඉතිරි ඒවා විවිධ භාෂාවන්ගෙන් ආකුල වූ දුරවබෝධ මාගධියෙන් ලියා ඇත. එහෙයින් අපි එවැනි දෝෂ ඉවත් කර සම්පූර්ණ වූත්, පැහැදිලි විවරණයෙන් යුක්ත වූත්, අට්ඨකථා සංග්‍රහ කරමු'"** යනුවෙනි.

මේ අදහසට එකඟ වූ භික්ෂූහු රජුගේ අනුමැතිය ලබාගෙණ ජේතවන මහා විහාරයෙහි රජු විසින් ගොඩ නංවන ලද ධර්මශාලාවෙහි නැවත වරක් රැස් වී **විනය පිටකයට සාරත්ථදීපනියත්, සූත්‍ර පිටකය ප්‍රධාන නිකාය සතරට සාරත්ථමඤ්ජුසාවත් අභිධර්ම පිටකයට ලීනත්ථවණ්ණනා** යන ටීකාවත් රචනා කළහ.

ටීකා සංග්‍රහ කිරීමේ ප්‍රභවය පිළිබඳව මෙහි දක්වා ඇති විස්තරයෙහි කිසියම් සත්‍යයක් ඇති බව කිව හැකිය. නොයෙක් නිකායිකයන්ට අයත් භික්ෂූහු ධර්මය පිළිබඳ නොයෙක් කරුණු තමන්ට කැමැති පරිදි විස්තර කළහ. මේ අර්ථ දැක්වීම් 'ටීකා' හෙවත් අතිරේක අට්ඨකථා වශයෙන් ලියා පරම්පරානුගතව ගෙණ එනු ලැබ ඇත. සංඝ සමාජය තුළ විවිධ පුද්ගලයන් එක් වූ නිසා ඒවා සිංහල භාෂාවෙන් ද පාලි භාෂාවෙන් ද නොයෙක් භාෂා මිශ්‍රණයෙන් ද නොයෙක් අන්දමට ලියා ඇත. ටීකාවල වටිනා තොරතුරු අන්තර්ගත වූ අතර බොහෝ විට ධර්මය ඉගැන්වීමට සම්බන්ධ වූ නොයෙක් කරුණුවල පරම්පරානුගත ව්‍යාඛ්‍යාන ද වේ. බුදුගොස් හිමියන්ගේ අට්ඨකථා රචනයට පසු විවිධ රටවලින් උගත්හු ලංකාවට පැමිණි නිසා බොහෝ කරුණු එකතු වී ඇත. මේ විවිධ ටීකා

එකතු කොට ඒ සියල්ලේම සංග්‍රහයක් කිරීමට අවශ්‍ය විය. එබැවින් නිකාය සාමග්‍රියෙන් පසු ටීකාවන් පිළිබඳ තීරණයක් ගැණීමට **කාශ්‍යප** මාහිමියන් අදහස් කරන්නට ඇත. මේ අනුව ටීකා ග්‍රන්ථ එක් එක් පුගුලන්ගේ තනි කෘති නොව ආචාර්ය පරම්පරාවක කෘති ලෙස සැලකිය යුතු බව මලලසේකර මහතා අදහස් කරයි. ඒවා සඞ්ගායනා කොට සාකච්ඡා කිරීමෙන් අනතුරුව සම්පූර්ණ කර ඇත. ජේතවන විහාරයේ විසූ සාරිපුත්‍ර මාහිමියෝ මේ කාර්යයෙහිලා ප්‍රමුඛත්වය ගෙණ ක්‍රියා කළහ. සමහර විට උන්වහන්සේ මේ කාර්ය සඳහා තෝරා පත් කර ගන්නට ඇත. අනික් භික්ෂූන් සමඟ අදහස් විමසීමෙන් පසුව ස්වකීය නමින් ටීකා රචනා කිරීම සඳහා උන්වහන්සේ අවසර ගන්නට ඇත.

ටීකාකරණයට හේතු වූයේ අට්ඨකථාවේ පැවසෙන කරුණු පැහැදිලි නොවීමයි. අටුවා මතය ගැඹුරු වැඩි නිසා ඒවායේ ගැටලු ද ලිහිල් කිරීම පිණිස ටීකා ග්‍රන්ථ රචනා කළ බව විනයට්ඨකථාවට කළ සාරත්ථදීපනී නමැති ටීකාවේ ආරම්භක ගාථාවලින් හෙළි වේ. ටීකාවන්ගේ ප්‍රභවය සිදු වූයේ කෙසේද'යි සොයන පර්යේෂකයන්ට එම ගාථා වැදගත් වේ.

i. "පොරාණෙහි කතං යන්තු - ලීනත්ථප්පකාසනං,
න තං සබ්බත්ථ භික්ඛූනං - අත්ථං සාධෙති සබ්බසො"

ii. "දුවිඤ්ඤෙය්‍ය සභාවාය - සීහළාය නිරුත්තියා,
ගණ්ඨිපදෙසු'නෙකෙසු - ලිඛිතං කිඤ්චි කත්ථචි"

iii. "භාසන්තරං තතො හිත්වා - සාරමාදාය සබ්බසො,
අනාකුලං කරිස්සාමි - පරිපුණ්ණවිනිච්ඡයං"

සාරත්ථදීපනිය ලියවුනු කාලයේ පෝරාණයන් විසින් කරණ ලද '**ලීනත්ථප්පකාසනී**' නමින් තවත් ටීකාවක් ද තිබුණු බව මෙහි දැක්වේ. එය සැම කරුණකදී ම සර්වප්‍රකාරයෙන් අර්ථය ලබා නොදෙන බව ද මෙයින් පැවසේ. එමෙන්ම සිංහල භාෂාවෙන් රචිත ගණ්ඨිපද හෙවත් ගැටපද හා වෙනත් නොයෙක් පොත් තිබුණු බව ද වැඩිහරියක් ඒවා අසාර වූත්, ආකුල වූත් ඒවා බව ද මෙහිදී ඒවායෙහි සාරය ගෙණ සම්පූර්ණ විනිශ්චය නිරවුල්ව පාලි භාෂාවට නඟා ඉදිරිපත් කරණ බව ද මෙම ගාථාවලින් පැවසේ.

පොළොන්නරු සමය වන විට මැනවින් පාලි භාෂාව උගත් භික්ෂූන් වහන්සේලා හිඟ වූහ. ඒ නිසා තව තවත්, බුද්ධ වචනය (ධර්මය නොව භාෂාව) ලිහිල් කොට ලියන්නට භික්ෂූන්ට සිදු විය. ටීකාවලින් කරණ ලද්දේ ද එසේ ලිහිල් කොට අර්ථ පැහැදිලි කිරීමකි. ටීකාකරණය නිසා පාලි භාෂාවට තව තවත් වචන එකතු විය. විවේචනය කිරීමේ පාලි රචනා ශෛලිය ද බොහෝ දුරට දියුණු වී ගියේය. අටුවාවලත් ප්‍රතිවිරුද්ධ මත දක්වා ඇතත් ටීකාවල තරම් ඒවා බලවත් නොවේ. සමහර විට මේ ටීකාකරණයට හේතු වූයේ හෙළ බසින් තිබූ ගණ්ඨිපද විය හැකිය. **ගණ්ඨිපද අනුගමනය කිරීමෙන් ටීකා ග්‍රන්ථ නිපදවා ගැණීමට කරුණු ඇත.** (නමුත් මෙම මතයට විරුද්ධ මතයක් මහාචාර්ය, ලිලීද සිල්වා මැතිණිය දක්වා ඇත. 'සම්භාෂා විද්‍යොදය කලාපය-130') ටීකාවලින් වැඩි ප්‍රමාණයක් සිංහල ගැටපද ක්‍රමයම අනුගමනය කර ඇත. අර්ථ තේරුම් ගැණීම අපහසු වූ සිංහලෙන් ලියන ලද ගණ්ඨිපද රාශියක් තිබුණු බව ඉහත දෙවන ගාථාවෙන් පැහැදිලි වේ.

පාලියෙනුත් ලියන ලද ග්‍රන්ථ රැසක් තිබුණත් ඒවා ද, ආකුල වූ නිසා තේරුම්ගත නොහැකි බව ද, නා නා දේශවාසීන්ගේ ප්‍රයෝජනය පිණිස සාරත්ථදීපනී විනය ටීකාව රචනා කළ බව ද එහි වැඩිදුරටත් සඳහන් වේ. එහි දැක්වෙන අන්දමට සිංහලෙන් ලිඛිත ගැටපද තුණක් තිබුණු බව පෙනේ. එනම්,

i. චූල ගණ්ඨිපද
ii. මජ්ඣිම ගණ්ඨිපද
iii. මහා ගණ්ඨිපද යනුවෙනි.

ටීකා ග්‍රන්ථ රචනා කිරීමෙන් පසුව ඒ මුල් සිංහල ගණ්ඨිපද අභාවප්‍රාප්ත වන්නට ඇතැ'යි අනුමාන කළ හැකිය. එහෙත්, ගැටපද ක්‍රමය අභාවය නොගිය බව ධම්පියා අටුවා ගැටපදය සහ ජාතක අටුවා ගැටපදය ආදි ග්‍රන්ථවලින් ප්‍රකට වේ. (ලිලීද සිල්වාගේ අදහස අනුව මේවායෙහි චිරපැවැත්මට හේතුව ජනයා අතර එම ග්‍රන්ථ පරිශීලනය බහුල වීම නිසාවෙනි.)

ලඞ්කාවේ දී පාලි භාෂාවෙන් ලියන ලද ටීකා ග්‍රන්ථ ඇත්තේ සීමා සහිත ගණනකි. ප්‍රකරණ සඳහා ලියන ලද ටීකාවන්ගේ ගණන අති විශාල ය. **මොග්ගල්ලායන, කච්චායන, රූපසිද්ධි** ආදි පාලි ව්‍යාකරණ ග්‍රන්ථවලට පවා ටීකා ග්‍රන්ථ ලියා ඇත. බුරුමයේ ද පාලි පොත් සඳහා ලියන ලද ටීකා ඇත. පාලි සාහිත්‍යයේ එන නොයෙක් ග්‍රන්ථ සඳහා ලිඛිත ටීකා ග්‍රන්ථ රැසක් ඇතත්, ඒවා වැඩි ප්‍රමාණයෙන් තවම මුද්‍රණද්වාරයෙන් එළි දක්වා නැත. ලක්දිව ඒ ඒ අවධිවල ජීවත් වූ ප්‍රසිද්ධ උගතුන්ගෙන් වැඩි දෙනෙකුම ටීකාකරණයෙහි නිරතව සිටි බව පහත සඳහන් ටීකා ග්‍රන්ථාවලියෙන් විශද වේ.

# ටීකා වර්ගීකරණය

පාලි භාෂාවෙන් රචිත සියලුම ටීකා ග්‍රන්‍ථ ප්‍රධාන වර්‍ග සතරකට වෙන් කළ හැකිය. එනම්,

i. **ත්‍රිපිටක අට්ඨකථා ටීකා**
ii. **ප්‍රකරණ ටීකා**
iii. **ඡන්‍දොලඞ්කාර ටීකා**
iv. **ව්‍යාකරණ ටීකා**

මෙයින් පළමුවන වර්‍ගය, විනය ටීකා, සූත්‍ර ටීකා, අභිධම්ම ටීකා යනුවෙන් වර්‍ග තුණකට වෙන් කළ හැකිය.

i. **ත්‍රිපිටක අට්ඨකථා ටීකා**
ii. **විනය ටීකා**

# 01. විනය ටීකා

## 1. වජිරබුද්ධි ටීකා

වජිරබුද්ධි ටීකාව විනය අටුවාවේ දුරවබෝධ තැන් ප්‍රකට කිරීම සඳහා මුලින්ම ලියවුණු ටීකාවයි. වජිරබුද්ධි නමැති තෙර නමක් විසින් ලියන ලද බැවින් ඒ නමින් ව්‍යවහාර වේ. මෙහි ඇති සදොස් තැන් සාරත්‍ථදීපනියෙහි දක්වන ලද බැවින් මහා පැරකුම්බා කාලයට පෙර සම්පාදිත වූ ටීකාවක් වශයෙන් සැලකිය හැකිය.

## 2. සාරත්‍ථදීපනී ටීකාව

මෙය දෙවන විනය ටීකාව යි. මහා පරාක්‍රමබාහු රජුගේ කාලයේදී පොළොන්නරුවේ වැඩ සිටි **සාරිපුත්‍ර** සඞ්ඝරාජයන් විසින් සම්පාදනය කරණ ලද'යි සමහරු අනුමාන කරති. මුන්වහන්සේ දිඹුලාගල ආරණ්‍යයෙහි වාසය කළ, මහා පරාක්‍රමබාහු රජුගේ ශාසන ශෝධනයෙහි මුල් වූ **කාශ්‍යප සඞ්ඝරාජ** මාහිමියන්ගේ ශිෂ්‍යවරයෙකි. 'සුමෙධ' නමින් ප්‍රකට ව මහතෙර නමකගෙන් ධර්‍ම-ශාස්ත්‍රය උගෙණ ඇත. පාලිමුත්තකවිනයවිනිච්ඡය ටීකා, **මනෝරථපූරණී (සාරත්‍ථමඤ්ජුසා) ටීකාව** ද මේ කතුවරයාගේ ම තවත් වටිනා ටීකාද්වයකි. මේ නිසා පොළොන්නරු යුගයේ ප්‍රභවයට වූ පාලි ටීකා සාහිත්‍යයේ වැදගත් තැනක් සාරිපුත්‍ර සඞ්ඝරාජයන් වහන්සේට හිමි වේ. මහා පරාක්‍රමබාහු රජතුමාගේ ඇරයුමෙන් සාරත්‍ථදීපනී විනය ටීකාව ලියන ලද බව එම ග්‍රන්‍ථාවසානයෙහි සඳහන් වන බැවින් ක්‍රි.ව. 1155-1186 අතර කාලයක මේ ටීකාව ලියන්නට ඇතැ'යි සිතිය හැකිය.

**"විනයෙ පාටවත්‍ථාය - සාසනස්ස ච වුද්ධියා**

**වණ්ණායො සමාරද්ධා - විනයට්ඨකථාය සා**

අජ්ඣෙසිතො නරින්දෙන - සො'හං පරක්කමබාහුනා

සද්ධම්මට්ඨිතිකාමෙන - සාසනුජ්ජොතකාරිනා"

*(විනය පිළිබඳ දක්‍ෂකම සඳහා ද, බුද්ධශාසනයේ අභිවෘද්ධිය සඳහා ද, විනය අට්ඨකථාවගේ යම් වර්‍ණනාවක් අරඹන ලද්දී නම් ඕ තොමෝ, සද්ධර්‍මයාගේ චිර පැවැත්ම කැමැති වූ, බුදුසසුන් බබළවන්නා වූ, පරාක්‍රමබාහු රජු විසින් ආරාධනා කරණු ලැබූ ඒ මම...)*

## 3. විමතිවිනොදනී ටීකාව (විමති+වි+√නුද)

මෙය තුන්වැනි විනය ටීකාව යි. සැරියුත් මහ තෙරුන් වහන්සේ සාරත්‍ථදීපනී විනය ටීකාව ලියමින් වජිරබුද්ධි ටීකාවේ ඇතැම් අදහස් විවේචනය කළාක් මෙන් ම මේ විමතිවිනෝදනී ටීකාව ලියූ **චොළිය කාශ්‍යප** මහ තෙරුන් විසින් සාරත්‍ථදීපනියේ ඇතැම් අදහස් විවේචනය කර ඇත. මේ කාශ්‍යප තෙරුන් වහන්සේ මහා පරාක්‍රමබාහු රජ සමයේ විසූ ශාරිපුත්‍ර සඞ්ඝරාජයන්ට පසුව විසූ නමුත්, දීර්‍ඝ කාලයකට පසුව නොවේ. **විනයවිනිච්ඡය ටීකාව** ලියූ සැරියුත් මාහිමියන්ගේ ශිෂ්‍ය වූ **වාචිස්සර** මාහිමියන්ට ඒ සඳහා ආරාධනා කළ උතුමන් අතර මුන්වහන්සේගේ නම ද ඇති නිසා සැරියුත් මාහිමියන්ට ආසන්න කාලයක විසුවේ යැ'යි සිතිය හැකිය.

## 4. විනයත්‍ථමඤ්ජුසා

මේ නමින් හැඳින්වෙන්නේ භික්‍ෂු-භික්‍ෂුණී දෙපිරිස සඳහා ඔවුන්ගේ විනය සම්බන්‍ධයෙන් බුදුරදුන් පණවා වදාළ විනය ශික්‍ෂාපද ඇතුළත් ප්‍රාතිමෝක්‍ෂයෙහි අටුවාව වන කඞ්ඛාවිතරණිය පැහැදිලි කරමින් ලියන ලද ටීකාවයි. එය වනාහි **සුමෙධ** නම් මහ තෙරුන් විසින් ආරාධනා කරණු ලැබ **බුද්ධනාග** නමැති තෙරුන් විසින් රචනා කරණ ලද්දකි. මේ ටීකාව සම්පාදනය කළ බුද්ධනාග නමැති තෙරුන් වහන්සේ ද ශාරිපුත්‍ර සඞ්ඝරාජයන්ගේ ශිෂ්‍යයෙකු බව එහි එන නිගමන ගාථාවලින් පැහැදිලි වේ. එහි පොළොන්නරුවේ රජ කළ මහා පරාක්‍රමබාහු රජතුමා නිකායත්‍රය සමගි කරවා සිරිලක එක් සේසත් කර වූ බවත්, බුදුරදුන්ගේ දළදා වහන්සේ තැන්පත් කිරීම සඳහා මනහර දළදා මැඳුරක් කර වූ බවත්, ජේතවන වෙහෙර කරවා භික්‍ෂූන්ට පිදූ බවත්, ග්‍රන්‍ථධුරය හා විදර්‍ශනා ධුරයන්හි නිරත භික්‍ෂූන්ට සිවුපසයෙන් සංග්‍රහ කරවූ බවත් එහි දක්වේ. ඒ රජතුමා විසින් පසුව පුෂ්පාරාමාදියෙන් යුත් පශ්චිමාරාමයක් කළ බවත්, එහි **චොළකුන්තක** නමැති පිරිවෙණෙහි වාසය කළ බුද්ධනාග නමැති තෙරුන් වහන්සේ විසින් මෙම ග්‍රන්‍ථය රචනා කළ බව එම නිගමන ගාථාවල දක්වා ඇත. මෙම ග්‍රන්‍ථය භික්‍ෂූන් වහන්සේලාට අතිශයින් ප්‍රයෝජනවත් වූ මහාවිහාරවාසීන්ගේ අදස්වලට එකඟ වූ මාතිකා උභය ප්‍රාතිමෝක්‍ෂයේ එන ශික්‍ෂාපදයන්හි සැඟවුණු අර්‍ථයන් ප්‍රකාශ කරණ වටිනා විනය ග්‍රන්‍ථයකි.

## 02. සූත්‍ර ටීකා

### 1. ලීනත්‍ථප්පකාසිනී ටීකාව

'**සුමඞ්ගලවිලාසිනී, පපඤ්චසූදනී, සාරත්‍ථප්පකාසිනී**' යන අටුවාත්‍රයේ ටීකාවයි. මෙහි කතුවරයා නම්, විසුද්ධිමග්ගටීකාව ලියන ලද **අට්ඨකථාචාර්ය භදන්ත ධම්මපාල** තෙරුන් වහන්සේ ය. දීඝනිකාය ටීකාව අවසානයේ "**පරිමාණතො සාධිකට්ඨවීසසහස්සමත්තගන්‍ථෙන දීඝනිකායටීකා විරචිතා ආචරිය ධම්මපාලෙන**" යන ප්‍රකාශයෙන් ඒ බව පැහැදිලි වේ.

### 2. සාරත්‍ථමඤ්ජුසා ටීකාව

මනෝරථපූරණී අටුවාවෙහි ගැටලු තැන් පැහැදිලි කරමින් ලියන ලද ටීකාව 'සාරත්‍ථමඤ්ජුසා' නමින් හැඳින් වේ. මෙම ග්‍රන්‍ථය සාරත්‍ථදීපනී විනය ටීකාව ලියූ **ශාරිපුත්‍ර** සඞ්ඝරාජයන් වහන්සේ විසින් රචිත ය. ධම්මපාලාචාර්යයන් වහන්සේ විසින් සූත්‍ර පිටකයේ නිකාය සතරටම ටීකා ලියන අදහසින් මුල් නිකාය තුණෙහි ටීකා ලියූ නමුත්, අඞ්ගුත්තරනිකාය ටීකාව ලියන්නට නොහැකි වී ඇත. එම අඩාල ව තිබුණු පොත් උන්වහන්සේගෙන් පසුව විසූ ටීකාචාර්ය සැරියුත් තෙරුන් විසින් මහ පැරකුම්බා රජුගේ ආරාධනාවෙන් සාරත්‍ථමඤ්ජුසා නමැති මේ ටීකා ග්‍රන්‍ථය ලියා ඇත.

## 3. අභිධම්ම ටීකා

### 1. පරමත්‍ථප්පකාසිනී අභිධම්මමූල ටීකාව

'**අත්‍ථසාලිනී, සම්මොහවිනොදනී, පඤ්චප්පකරණට්ඨකථා**' යන අභිධර්ම අටුවා සියල්ලටම පරමත්‍ථප්පකාසිනී නමැති ටීකා ග්‍රන්‍ථය සම්පාදනය කළේ **ආනන්‍ද වනරතන** නමැති තෙරුන් වහන්සේ විසිනි. මෙය රචනා කිරීම සඳහා ආරාධනා කොට ඇත්තේ **ධම්මමිත්ත** නමැති තෙරුන් වහන්සේ ය. මෙය ආනන්‍ද ආචාර්යතුමා වනාහී අට්ඨකථාචාර්ය ධම්මපාල මහතෙරුන්ට පෙර විසූ කෙනෙකි. මෙම අභිධම්මමූලටීකාවට අනුටීකාව ලියන ලද්දේ ධම්මපාලාචාර්යතුමා විසිනි. උන්වහන්සේ මහපැරකුඹ්බා රජුට පෙර විසූ කෙනෙකි.

## ප්‍රකරණ ටීකා

### 1. පරමත්‍ථමඤ්ජුසා ටීකාව

සමස්ත ත්‍රිපිටකයටම පොදු අටුවාවවක් ලෙස සැලකෙන බුද්ධඝෝෂ තෙරුන් විසින් රචිත විසුද්ධිමග්ගයට **භදන්තාචාර්ය ධම්මපාල** තෙරුන් විසින් රචිත **විසුද්ධිමග්ග ටීකාව** පරමත්‍ථමඤ්ජුසා නම්. මේ ග්‍රන්‍ථය විසුද්ධිමාර්ගය මෙන් දෙගුණයක් තරම් අතිවිශාල ග්‍රන්‍ථයකි. මෙහි කතුවරයා නම් දෙවෙනි අටුවාචාර්යවරයා ලෙස පාලි සාහිත්‍යයේ සඳහන් වන **බදිරතිත්‍ථවාසී ධම්මපාල** තෙරුන් වහන්සේය. මෙම ග්‍රන්‍ථය ඉතා ව්‍යක්ත භාෂා ශෛලියකින් රචිත ගැඹුරු ග්‍රන්‍ථයක් ලෙස උගතුන් විසින් පිළිගෙණ ඇත. මෙය රචනා කරණ ලද්දේ **දාඨානාග** නමැති තෙරුන් වහන්සේගේ

ආරාධනයෙන් බව එම ග්‍රන්ථයේ පැවසේ. මහාවිහාරවාසීන්ගේ අමිශ්‍ර වූ, අනාකුල වූ වාචනා මාර්‍ගය ඇසුරෙන් බුද්ධදේශනාවට විරුද්ධ නොවන ලෙස මෙම පරමත්ථමඤ්ජුසා නමැති ටීකාව රචනා කරණ ලද බව එහි සඳහන් වී ඇත.

## 2. අභිධම්මත්ථවිකාසිනී ටීකාව

මෙය අභිධම්මාවතාරයට ලියන ලද ටීකා ග්‍රන්ථයකි. බුද්ධදත්ත හිමියන්ගේ **අභිධම්මාවතාරයට** ශාරිපුත්‍ර මාහිමියන්ගේ ශිෂ්‍ය **සුමඞ්ගල** නමැති හිමියන් විසින් මේ ටීකාව සම්පාදනය කර ඇත.

## 3. අභිධම්මත්ථසඞ්ගහසඞ්ඛෙප ටීකාව

ශාරිපුත්‍ර මාහිමියන්ගේ ශිෂ්‍ය **ඡප්පද** තෙරුන් විසින් රචිත යි. **අනුරුද්ධ** තෙරුන් විසින් සම්පාදිත **අභිධම්මත්ථසඞ්ගහ** නමැති ග්‍රන්ථය සංක්ෂේපයෙන් පැහැදිලි කරමින් මෙම ටීකාව උන්වහන්සේ විසින් රචනා කර ඇත.

i. සච්චසංඛෙපටීකා
ii. මූලසික්ඛා අභිනවටීකා
iii. පරමත්ථවිනිච්ඡය ටීකා
iv. බුද්දකසික්ඛා සුමඞ්ගලපසාදනී ටීකා
v. නෙත්ති අට්ඨකථා ටීකා
vi. විනයවිනිච්ඡය ටීකා
vii. මහාවංසටීකා (වංසත්ථප්පකාසිනී)
viii. නාමරූප පරිච්ඡේද ටීකා

# ඡන්දොලඞ්කාර ටීකා

i. වුත්තොදය ටීකා
ii. සුබොධාලඞ්කාර ටීකා

# ව්‍යාකරණ ටීකා

i. රූපසිද්ධි ටීකා
ii. කච්චායන න්‍යාස ටීකා
iii. පඤ්චිකා ටීකා
iv. බාලාවතාර ටීකා
v. පදසාධන ටීකා
vi. සද්දසාරත්ථජාලිනී ටීකා
vii. සද්දවුත්ති ටීකා
viii. සද්දබින්දු ටීකා

# පාලි අට්ඨකථා තේරුම් ගැනීමට ටීකා උපයෝගී වන අයුරු

පාලි අට්ඨකථාවල පැහැදිලි කළ යුතු වචන හා ධර්මකරුණු පැහැදිලි කිරීමේ අරමුණින් ටීකා සම්පාදිත බව ඉහත දැක්විනි. **සමන්තපාසාදිකාවට ලියන ලද සාරත්‍ථදීපනී** නමැති විනය ටීකාවේ නිදර්ශන කිහිපයක් සාකච්ඡා කිරීමෙන් එම කරුණ පැහදිලි කර ගත හැකිය. බුදුරදහු පිරිනිවි අවස්ථාවෙහි මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ වෙත සිටි **සුභද්‍ර** නමැති භික්ෂුව අභද්‍ර වචනයක් ප්‍රකාශ කළ බවත්, එම වචනය ගැණ සලකා ප්‍රථම ධර්ම සඞ්ගායනාව සිදු කොට බුද්ධවචනය ආරක්‍ෂා කර ගැණීමට තීරණය කළ බව සමන්තපාසාදිකාවේ දැක්වේ. සුභද්‍ර භික්ෂුව එම ප්‍රකාශය කළේ කුමක් නිසාදැ'යි අටුවාවේ සඳහන් නොවේ. සුභද්‍ර භික්ෂුව එම ප්‍රකාශය කරණ ලද්දේ මක් නිසාදැ'යි ටීකාවේ මෙසේ සඳහන් වේ.

> "**තත්‍ථ සුභද්දොති තස්ස නාමං. වුඩ්ඪකාලෙ පන පබ්බජිතත්තා වුඩ්ඪපබ්බජිතොති වුච්චති. අලං ආවුසොති ආදිනා තෙන වුත්තවචනං නිදස්සෙති. සො හි සත්තාහපරිනිබ්බුතෙ භගවති කස්මා පන සො එවමාහ....භගවති ආඝාතෙන**" (සාරත්‍ථදීපනී)

බුදුරජාණන් වහන්සේ කුසිනාරාවෙන් නික්ම 1250 පමණ භික්ෂූන් සමඟ ආතුමා ප්‍රදේශයට වඩින කල්හි බුදුරදුන් වඩින බව අසා සාමණේර භික්ෂූන් යවා කැඳ සැදවීමට අවශ්‍ය උපකරණ දායකවරුන්ගෙන් පිණ්ඩපාතය මඟින් ඉල්වාගෙණ ඇවිත් මුළු රාත්‍රියෙහි ම අවශ්‍ය කටයුතු සම්පාදනය කොට පසුදින උදෑසන බුදුරදුන්ට කැඳ පිළිගැන්වීය. බුදුන් වහන්සේ එය වැළඳීම අකැප බව පවසා අකප්පිය සමාදාන ශික්ෂාපදය පණවා ප්‍රතික්ෂේප කොට පිණ්ඩපාතයෙහි වැඩි සේක. අනෙක් භික්ෂූහු ද එය ප්‍රතික්ෂේප කළහ. මෙයින් නොසතුටු වූ සුභද්‍ර භික්ෂුව බුදුරදුන් කෙරෙහි වෛර බැඳ ගති. "**අහිතකාමො අයං මය්හං'ති භගවති අඝාතං බන්ධි**" බුදුරදුන් පිරිනිවි බව අසා සතුට ප්‍රකාශ කිරීමට, "**අලං ආවුසො මා සොචිත්‍ථ...**" ආදි ප්‍රකාශය කළේ ඒ නිසා බව ටීකාවෙහි විස්තර කෙරේ.

ප්‍රථම ධර්ම සඞ්ගායනාවේදී මහාකාශ්‍යප මහරහතන් වහන්සේට ප්‍රධානත්‍වය දීමට හේතුව වශයෙන් ටීකාව පහත සඳහන් කරුණු දක්වා ඇත. **එනම්, ගව් තුණක් බුදුරදුන් පෙර ගමන් ගොස් ගෞරව කිරීම යි. අවවාද තුණකින් උපසම්පදාව දීම, බුදුරදුන් සතු සිවුරක් මහකසුප් තෙරුන්ට දී මහසුප් තෙරුන්ගේ සිවුර බුදුරදුන් පෙරවා ගැණීම යි. මෙසේ සිවුරු හුවමාරු කර ගැණීමෙන් බුදුරදුන් හා සම තත්ත්වයෙහි ලා තබා ගැණීම යි. චන්‍දොපම ප්‍රතිපදාව දේශනා කිරීම, තෙවරක් ම ශාසනය පැවරීම** යනුවෙනි.

"**අථ ඛො ආයස්මා ආනන්‍දො උට්ඨායාසනා එකංසං චීවරං කත්‍වා ථෙරෙ භික්ඛූ වන්‍දිත්‍වා ධම්මාසනෙ නිසීදි. දන්තඛචිතං වීජනිං ගහෙත්‍වා...**" යනුවෙන් සමන්තපාසාදිකාවේ සඳහන් වන පරිදි අනඳ මාහිමි විජිනිපත ගෙණ සඞ්ගායනාව සඳහා ධර්මාසනයෙහි වැඩ හුන්සේක යනුවෙන් සඳහන් වේ. විජිනිපත ගැණීම ධර්මදේශකයන්ගේ ධර්මතාවක් බව ටීකාවේ පැහැදිලි කොට ඇත. **(වීජනීගහණං ධම්මකථිකානං ධම්මතා.)**

"**ඉධ එකච්චෙ මොඝපුරිසො ධම්මං පරියාපුණන්ති. අත්‍ථං න උපපරික්ඛන්ති**" යනුවෙන් අට්ඨකථාවෙහි දැක්වෙන පාඨය ටීකාවෙහි විස්තර කරන්නේ මෙසේ ය.

**"ඉධා'ති ඉමස්මිං සාසනෙ. එකච්චෙ මොඝපුරිසා'ති එකච්චෙ තුච්ඡපුරිසා. ධම්මන්ති පාළිධම්මං, පරියාපුණන්තීති උග්ගණ්හන්ති, අත්‍ථං සජ්ඣායන්ති චෙව වාචුග්ගතං කරොන්තා ධාරෙන්ති චාති වුත්තං හොති. අත්‍ථන්ති යථාභූතං භාසිතත්‍ථං පයොජනත්‍ථඤ්ච. න උපපරික්ඛන්තීති න පරිගණ්හන්ති න විචාරෙන්ති"** (සාරත්‍ථදීපනී ටීකා)

සමන්තපාසාදිකාවේ පඨමමහාසඞ්ගීති විස්තරය අවසානයේ එන, **"අඤ්ඤංපි උද්දානසංගහ, වග්ගසංගහ, පෙයයාලසංගහ එකකනිපාත දුකනිපාතාදි නිපාතසංගහ, සුත්තසංගහ, පණ්ණාසකසංගහාදිමනෙකවිධං තීසු පිටකෙසු සන්දිස්සමානං සංගහප්පභෙදං වවත්‍ථපෙත්වා එවං සත්තහි මාසෙහි සඞ්ගීතං"** යන පාඨය විස්තර කරණ සාරත්‍ථදීපනී ටීකාව ඒ එක් එක් කරුණ මෙසේ විස්තර කර ඇත. එහි උද්දානසංගහ නම්, පඨමපාරාජිකාවේ එන විනීතවත්‍ථු ආදිය පිළිබඳ ධර්ම ග්‍රාහයකන් විසින් සංක්ෂේපයෙන් කරීත සංග්‍රහ ගාථාවන් ය. නිදසුනක් වශයෙන්,

"මක්කටී වජ්ජිපුත්තා ච ගිහීනනග්ගො ච තිත්‍ථියා

දාරිකුප්පලවණ්ණා ච - බ්‍යඤ්ජනෙහි අපරෙ දුවෙ"

එහි වර්ග සංග්‍රහ වනාහි, සීලක්ඛන්ධවග්ග, මූලපරියායවග්ග යනාදි වශයෙන් සංග්‍රහ කර ඇත. පෙයයාලසංගහ වශයෙන්, උත්තරිමනුස්සධම්මපෙයයාල, නීලචක්කපෙයයාල වශයෙන් ද, එකකනිපාත ආදි සංගහ යනු අඞ්ගුත්තරනිකාය ආදි වශයෙනි. සංයුත්ත සංගහො යනු, සංයුත්තනිකායේ දෙවතාසංයුත්ත ආදි වශයෙන් ද, පණ්ණාසක යනු, මජ්ඣිම නිකාය ආදියෙහි මූලපණ්ණාසක ආදි වශයෙනි.

මෙසේ පාලි අට්ඨකථාවේ එන පාඨ විස්තරාත්මකව දැක්වීම එහි ටීකාවෙන් සිදු කෙරෙණ බවත්, අටුවා තේරුම් ගැණීමට එහි ටීකාව ආධාර වන අයුරුත් ඉහත දැක්වූ නිදසුන්වලින් පැහැදිලි වේ.

ටීකා ග්‍රන්‍ථ පරිශීලනය කිරීමෙහි ප්‍රයෝජන මහත් රාශියක් ඇත. ඓතිහාසික තොරතුරු දැන ගැණීමට ද, ග්‍රන්‍ථාගත මතභේද සහ ලක්දිව විවිධ සමාජ තොරතුරු දැන ගැණීමට ද, ලඞ්කාවේ බුදුසමය පිරිහී ගිය අවධියේ තත්ත්වය කෙබඳුද'යි දැන ගැණීමට ද, ජාතක කථා ආදියෙහි එන චරිතකථා විකාසයට පැමිණි අයුරු දැන ගැණීමට ද, ටීකා ග්‍රන්‍ථ උපකාරී වේ.

ත්‍රිපිටක සාහිත්‍ය ඉතිහාසයත්, ලඞ්කා ශාසන ඉතිහාසයත් පිළිබඳ ව මූලාශ්‍රයක් වශයෙන් විශේෂයෙන් ම සාරත්‍ථදීපනී විනයටීකාවෙහි බාහිරනිදානවණ්ණනාව අතිශයින් අගයක කළ හැකිය. **දඹදිව පැවැත් වූ සඞ්ගායනා තුණත්, ලක්දිව බුදුසසුන පිහිටුවීම, ශ්‍රී මහා බෝධිය වැඩම වීම, පිළිබඳ සමන්තපාසාදිකාවේ සඳහන් වන තොරතුරු තවදුරටත් විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.** එබැවින් ඓතිහාසික ග්‍රන්‍ථයක් ලෙස එම ග්‍රන්‍ථයට ඉතා වැදගත් තැනක් හිමි වේ.

ප්‍රථම ධර්ම සඞ්ගායනාව පැවැත් වූ අකාරය පිළිබඳ ව සමන්තපාසාදිකාවට වඩා වැඩිපුර විස්තර රාශියක් එහි ටීකාව වන සාරත්‍ථදීපනියෙන් අනාවරණය වේ.

**"එතෙනෙව උපායෙන පඤ්චපි නිකායෙ පුච්ඡි. පඤ්චනිකායා නාම දීඝනිකායො මජ්ඣිමනිකායො සංයුත්තනිකායො අඞ්ගුත්තරනිකායො ඛුද්දකනිකායො නාම චත්තාරො නිකායෙ ඨපෙත්වා අවසෙසං බුද්ධවචනං. තත්‍ථ විනයො ආයස්මා උපාලිත්ථෙරෙන විස්සජ්ජිතො. සෙස ඛුද්දකනිකායො චත්තාරො නිකායා ආනන්දත්ථෙරෙන."**

(සමන්තපාසාදිකා)

යනුවෙන් නිකාය පස ම ප්‍රථම සඞ්ගායනාවේදී සඞ්ගීත බව පාලි අට්ඨකථාවේ පැවසෙතත්, ඒවා කටපාඩමින් පවත්වා ගෙණ ඒම සඳහා ඒ ඒ ආචාර්‍ය පරම්පරාවන්ට බාරදුන් බවක් එහි සඳහන් නොවේ. එහෙත් එම ටීකාවේ එන පහත සඳහන් පාඨයෙන් ත්‍රිපිටකයේ ඒ ඒ කොටස් ආරක්‍ෂා කර ගැණීමට බාරදුන් ආචාර්‍ය පරම්පරා හෙවත් භාණක පරම්පරා ගැණ ද සඳහන් කර ඇති නිසා ත්‍රිපිටක සාහිත්‍යයේ ඉතිහාසය සම්බන්‍ධයෙන් මෙම කොටස ඉතා වැදගත් වේ.

**"අයං දීඝනිකායො නාමා'ති වත්‍වා ආයස්මන්තං ආනන්දත්ථෙරං පටිච්ඡාපෙසුං ආවුසො ඉමං තුය්හං නිස්සිතකෙ වාචෙහීති."** (සාරත්‍ථදීපනී)

යනුවෙන් දීඝනිකාය අනඳ තෙරුන් වහන්සේට ද, මජ්ඣිමනිකාය සැරියුත් තෙරුන් වහන්සේගේ ශිෂ්‍යයන්ට ද, සංයුත්තනිකාය මහසුප් තෙරුන්ට ද, අඞ්ගුත්තරනිකාය අනුරුද්ධ තෙරුන්ට ද, විනය පිටකය උපාලි තෙරුන්ට ද, බාරදුන් බව ටීකාවේ එන විස්තරයෙන් දත හැකිය.

ඛුද්දකනිකායට අයත් ග්‍රන්‍ථ සියල්ල සඞ්ගායනා කොට අභිධර්‍ම පිටකයට ම අන්තර්ගත ගළ බව එහි සඳහන් වේ. එහෙත් මේ පිළිබඳ දීඝභාණකයින් සහ මජ්ඣිමභාණකයින් යන දෙපරිස අතර මතභේදයක් පවතී. මජ්ඣිමභාණකයින්ගේ මතය අනුව, චරියාපිටක, බුද්ධවංස යන ග්‍රන්‍ථ දෙකත් සමඟ ඛුද්දකනිකාය ග්‍රන්‍ථ 15 ක් සූත්‍ර පිටකයට ඇතුළත් කර තිබේ. ඒ ග්‍රන්‍ථ දෙක ජාතක ස්වභාවය ඇති කෘතිද්වයක් බැවින් 'ජාතක' යන්නට ම ඇතුළත් කර ගෙණ ඇති බව පෙනේ. ජාතක ආදිය අත්‍ථොත්පත්ති වශයෙන් දේශනා කර ඇති බැවින් අභිධර්‍ම පිටකයට නොව සූත්‍ර පිටකයට ම ඛුද්දකනිකාය ඇතුළත් කළ යුතු බව මජ්ඣිමභාණකවරුන්ගේ මතයයි. මජ්ඣිම භාණක මතය අනුව, චරියාපිටක, බුද්ධවංස යන ද්වය **"තත්‍ථ යුත්තං විචාරෙත්‍වා ගහෙතබ්බං"** යනුවෙන් එය සුදුසු පරිදි විමසා තේරුම් ගත යුතු බව විමසීමෙන් පාඨකයාට නිදහස ලබා දීම ටීකාවරුන්ගේ පිළිවෙත විය. ත්‍රිපිටකයේ වර්ගීකරණය පිළිබඳ විස්තරය ද අටුවාචාරීන්ගේ සැලකිල්ලට බඳුන් වූවාට වඩා සියුම් ලෙස ටීකාකරුවන්ගේ සැලකිල්ලට බඳුන් වී ඇති බව ත්‍රිපිටක සාහිත්‍ය ඉතිහාසය සම්බන්‍ධයෙන් මෙම තොරතුරු ඉතා වැදගත් බව පිළිගත යුතුය.

**"තත්‍ථ පඨමසඞ්ගීතියං සඞ්ගීතං ච අසඞ්ගීතඤ්ච සබ්බම්පි සමොධානෙත්‍වා උභයානි පාතිමොක්ඛානි ද්වෙ විභඞ්ගානි ද්වාවීසති ඛන්‍ධකානි සොළසපරිවාරානීති ඉදං විනයපිටකං නාම"** යනුවෙන් දැක්වෙන අට්ඨකථා පාඨය ටීකාවේ මෙසේය.

**"අසඞ්ගීතන්ති සඞ්ගීතිඛන්‍ධක කථාවත්‍ථුප්පකරණාදි කෙ චි පන සුභ සුත්තම්පි පඨමසඞ්ගීතියං අසඞ්ගීතන්ති වදන්ති තං න යුජ්ඣති"** (සාරත්‍ථදීපනී)

ප්‍රථම ධර්ම සඞ්ගායනාවේදී සඞ්ගායනා නොවූ දේ නම්, සඞ්ගීති සූත්‍ර, ඛන්ධක හා කථාවත්ථුප්පකරණය බවයි. ඇතමෙක් සුභ සූත්‍රයත් සඞ්ගායනා නොකළ බව පවසන නමුත් එය නුසුදුසු බව ටීකාකරු පවසයි. ආචාර්ය ධම්මපාල හිමියන්ගේ මතය අනුව, ප්‍රථම සංගීතියෙන් පෙර ම බුදුරදුන් පිරිනිවී ටික දිනකින් අනඳ මාහිමියන් සැවැත්නුවරදී සුභ නමැති තරුණයාට මෙම සුභ සූත්‍රය දේශනා කළ බව පිළිගැණේ. එහි **එවං මෙ සුතං**...යනාදී පාඨය අනඳ හිමියන් විසින් කීමට නුසුදුසු ය. මේ නිසා දෙවෙනි හෝ තුන්වෙන සංගායනාවලදී එම පාඨය එකතු කරන්නට ඇත. මෙසේ ටීකාවේ තර්කානුකූලව ද කරුණු පැහැදිලි කර ඇති අයුරු දැකීමට හැකිය.

## ටීකාචාර්යවරුන් සහ කෘතීන්

ක්‍රි.ව. **6 සිට** 13 සියවස දක්වා රචනා වී ඇති පාලි ටීකා සාහිත්‍යය බැබළ වූ යතිවරු බොහෝමයක් සිටිති. පොළොන්නරු යුගය කේන්ද්‍ර කොට ගණිමින් එම කාර්ය කළ බව පැහැදිලි ය. නිකාය සංග්‍රහය පොළොන්නරු යුගය තුළ වැඩ වෙසෙමින් පාලි ටීකා ග්‍රන්ථ රචනා කළ යතිවරුන්ගේ නාම ලේඛනයක් ද, ඔවුන්ගේ කෘතීන් ද ඉදිරිපත් කොට ඇත. එහිදී "**ශාරිපුත්‍ර මහා ස්වාමීන්ද්‍රයන් පටන් සඞ්ඝරක්ෂිතය, සුමඞ්ගලය, වාගීශ්වර ය, ධර්මකීර්තිය, නාගසේන ය, ආනන්ද ය, වෛදෙහ ය, බුද්ධප්‍රිය, අනොමදස්සී යනාදී මහාස්ථවිරයෝ නොයෙක් ටීකාර්ථ හා තත් ප්‍රවේශෝපාය වූ අනෙකප්‍රකාර ධර්මප්‍රබන්ධ හා සන්න-ගැටපද පිටපත් ආදිය උපදවා බුදුන්ගේ පර්යාප්ති ශාසනය බැබළවූහ....**" යනාදි වශයෙන් මෙම කාර්යයෙහි නියුක්ත ව සිටි භික්ෂූන්ගේ නම් රාශියක් ගෙණ හැර දක්වා ඇත. සමස්තයක් වශයෙන් ගත් කළ පාලි ටීකා ග්‍රන්ථ තුළ දක්නට ලැබෙන්නේ එක ම ආකෘතිකම ය රටාවක් නම් නොවේ. විවිධ විෂයක්ෂේත්‍ර ඔස්සේ ටීකා ග්‍රන්ථ රචනා කරණු ලැබීම ද ඉතා වැදගත් වේ. ඒ අනුව,

i. ත්‍රිපිටක අට්ඨකථා ටීකා
ii. ප්‍රකරණ ටීකා
iii. ඡන්දොලඞ්කාර ටීකා
iv. ව්‍යාකරණ ටීකා

යනුවෙන් වර්ග කළ හැකිය. මෙහිදී වැඩි වශයෙන් ටීකා රචනා කොට ඇත්තේ, ත්‍රිපිටකය අට්ඨකථා ගණයට අයත් ටීකාවන් ය. පහත දැක්වෙන්නේ ටීකා සම්පාදකයින් සහ උන්වහන්සේලාගේ කෘතීන් ය. ඒවා අයත් විෂය හා කාලය ඉදිරියෙන් දැක්වේ.

| අංකය | ටීකා නාමය | කතෘ නාමය | විෂය | සියවස |
|---|---|---|---|---|
| **01.** | මජ්ඣිමනිකායටීකා | ධම්මපාල හිමි | සූත්‍ර | 6 |
| **02.** | සංයුත්තනිකායටීකා | ධම්මපාල හිමි | සූත්‍ර | 6 |
| **03.** | ලීනත්ථපදවණ්ණනා | චුල්ලධම්මපාල හිමි | සූත්‍ර | 7 |
| **04.** | ලීනත්ථවණ්ණනා | චුල්ලධම්මපාල හිමි | සූත්‍ර | 8 |
| **05.** | වජිරබුද්ධිටීකා | වජිරබුද්ධි හිමි | විනය | 11 |
| **06.** | පඤ්චිකාලඞ්කාරටීකා | සාරිපුත්ත හිමි | ව්‍යාකරණ | 12 |
| **07.** | පාලිමුත්තකවිනයවිනිච්ඡයටීකා | සාරිපුත්ත හිමි | විනය | 12 |
| **08.** | මූලසික්ඛා | වාචිස්සර හිමි | විනය | 12 |
| **09.** | සම්බන්ධචින්තාටීකා | වාචිස්සර හිමි | ව්‍යාකරණ | 12-13 |
| **10.** | නාමරූපපරිච්ඡේදටීකා | වාචිස්සර හිමි | අභිධර්මය | 12 |
| **11.** | අභිධම්මත්ථදීපිකා පොරාණ ටීකා | වාචිස්සර හිමි | අභිධර්මය | 12 |
| **12.** | විනයත්ථමඤ්ජුසාටීකා | බුද්ධනාග හිමි | විනය | 12 |
| **13.** | විමතිවිනොදනීටීකා | චොළිය කස්සප හිමි | විනය | 12 |
| **14.** | වුත්තොදයටීකා | සඞ්ඝරක්ඛිත හිමි | ඡන්දොලඞ්කාර | 12 |
| **15.** | අභිධම්මත්ථවිකාසිනීටීකා | සුමඞ්ගල හිමි | අභිධර්මය | 12 |
| **16.** | අභිධම්මත්ථවිභාවිනී | සුමඞ්ගල හිමි | අභිධර්මය | 12 |
| **17.** | අභිධම්මත්ථසඞ්ගහ පොරාණටීකා | දිඹුලාගල මහාකාශ්‍යප හිමි | අභිධර්මය | 12 |
| **18.** | උත්තරවිනිච්ඡයටීකා | වාචිස්සර හිමි | අභිධර්මය | 12-13 |
| **19.** | ඛුද්දකසික්ඛාටීකා | සඞ්ඝරක්ඛිත හිමි | විනය | 13 |
| **20.** | කච්චායනසාරටීකා | බුරුමයේ මහයස හිමි | ව්‍යාකරණ | 14 |
| **21.** | අභිධම්මත්ථසඞ්ගහසඞ්ඛෙපටීකා | බුරුමයේ ඡප්පට හිමි | අභිධර්මය | 15 |
| **22.** | න්‍යාසප්පදීපය | බුරුමයේ ඡප්පට හිමි | ව්‍යාකරණ | 15 |
| **23.** | පඤ්චිකාප්‍රදීපය | තොටගමුවේ රාහුල හිමි | ව්‍යාකරණ | 15 |
| **24.** | මණිසාරමඤ්ජුසා | බුරුමයේ අරියවංස හිමි | අභිධර්මය | 15 |
| **25.** | අභිධම්මප්පදීපිකා නවටීකා | බුරුමයේ පඤ්ඤාසාමි හිමි | අභිධර්මය | 17 |
| **26.** | සුබොධිනීටීකා | හික්කඩුවේ සුමඞ්ගල නාහිමි | ව්‍යාකරණ | 19 |

# ටීකාවන්හි අර්ථකථන ක්‍රම

අට්ඨකථා රචනය තුළ නිරතුරුව ම දක්නට ලැබෙන අර්ථකථන ක්‍රමවේදයක් ඇත. එය අට්ඨකථාකරුවා සතු සුවිශේෂී දක්ෂතාවයකි. යමක් විස්තර කිරීමේදී ඊට අදාළ සියලු විස්තර ඉදිරිපත් කිරීමට අටුවාකරු නිරතුරු උත්සාහයක යෙදී සිටි බව ඉතා පැහැදිලි ය. එහිදී බුදුසමයට පසුබිම් වූ සියලු සිදුවීම් අඩුවකින් තොර ව ඉදිරිපත් කිරීමට වැඩි උත්සාහයක් ගෙණ ඇත. බෞද්ධ සම්ප්‍රදාය තුළ විසිරී පවතින නොයෙක් තොරතුරු ඉදිරිපත් කර ඇත. ටීකා තුළ දක්නට ලැබෙන සුවිශේෂත්වය නම්, අට්ඨකථා ක්‍රමවේදයට වඩා ක්‍රමවත් න්‍යායාත්මක අර්ථකථන ක්‍රමවේදයක් දක්නට ලැබීමයි. දීඝනිකාය ටීකාව තුළ මේ ක්‍රමවේදය නිරවුල් ව දැක්වීමට ටීකාචාර්යවරයා උත්සාහ කර ඇත. දීඝනිකාය බ්‍රහ්මජාල සූත්‍රවර්ණනාවේ සයාකාරයකින් අර්ථකථන ක්‍රමවේදයක් දක්නට ලැබේ.

**1. සම්බන්ධතො - සම්බන්ධය, නිදානය**

**2. පදතො - පද බෙදීම**

**3. පදවිභාගතො - ව්‍යාකරණ විභාග**

**4. පදත්ථො - අර්ථ ප්‍රකට කිරීම**

**5. අනුයොගතො - ප්‍රශ්න ඇසීම**

**6. පරිහාරතො - පිළිතුරු දීම**

මෙම ක්‍රමවේදය අට්ඨකථා තුළින් නිවැරදිව සිදු නොවූ බැවින් ටීකාකරුවා ක්‍රමවත් ව අර්ථ කථනය ඉදිරිපත් කර ඇත. **සම්බන්ධය යනු, දේශනාවට පසුබිම් වූ ස්ථානය, අරමුණු හා පුද්ගලයා ය.**

උදා:- විසාලා මහනුවර තෙවරක් විශාල වූ නිසා ඒ නම ලද බව අටුවාව පවසයි. ඒ සඳහා පාදක වූ කථාවස්තුව දැන ගත හැක්කේ ටීකාවෙනි.

ස්ථාන පිළිබඳ පමණක් නොව පුද්ගල චරිතවල ස්වභාවය පවා ටීකාකරුවන් ගෙණ හැර දක්වා ඇත.

ව්‍යාකරණානුකූල විග්‍රහයන්ට ටීකාචාර්යවරු වැඩි කැමැත්තක් දක්වා ඇත. එය මෙහිදී පදවිභාගතො යනුවෙන් දැක්වේ.

**"සන්ති සහත්ථෙ උපසග්ගො තෙන සද්ධිං උස්සුක්කවචනමෙතං සංවිච්චාදි සංවෙත්වාදි උස්සුක්කවචනන්ති අත්ථො උස්සුක්කවචනං නාම පුබ්බකාලකිරියාවචනං අයං හි සමානකත්තුකෙසු නිරුත්ති වොහාරො"**

යනුවෙන් නිරුත්තිය වැඩි වශයෙන් ගෙණ හැර දක්වා ඇත.

**"මිගා ච අජා ච එළකා ච තෙසං චම්මානීති සමාසො"**

උපමා රූපක ඉදිරිපත් කිරීම ද දක්නට ලැබේ. කථාපුවත් මඟින් විස්තර කිරීම් ද ඇත. අනුයොගතො, පරිහාරතො යන්නෙන් විමර්ශනාත්මක ව අන්‍ය ලබ්ධික මත දක්වන මේ කොටස ප්‍රශ්නෝත්තර ක්‍රමයක් විය හැකිය.

## ටීකා පරිශීලනයේ ප්‍රයෝජනය

විසුද්ධිමග්ගටීකාවේ අම්බබාදක මහාතිස්ස හිමියන්ගේ කථාපුවත ඉන් පෙර වෙනත් කෘතියක් දක්නට නොලැබුණකි. මෙරට ඉතිහාසය, සභ්‍යත්වය, ජාත්‍යන්තර සම්බන්ධතා ආදි තොරතුරු ටීකා තුළින් දත හැකිය. ලක්දිව ශාසන ඉතිහාසයේ බැමිණිතියා සාය අවස්ථාවේ මෙරට භික්ෂූන් විඳි අනේකවිධ දුක් ගැහැට මේ ටීකාවල විස්තර කර ඇති බැවින් ශාසනික තොරතුරු ගවේෂණය කරන්නෙකුට මේ තොරතුරු ඉතා වැදගත් වේ. ටීකාචාර්‍යවරයා ඉතිහාසඥයෙකුගේ තත්ත්වයට පත් වන බව පාලිමුත්තකවිනයවිනිච්ඡය ටීකාව තුළින් දැකිය හැකිය. ටීකා ග්‍රන්ථ පරිශීලනයේ වැදගත්කම මෙලෙස පෙළ ගැස්විය හැකිය.

1. ලක්දිව බුදුසමය පිරිහී ගිය අවධිය තුළ යථා තත්ත්වය.

2. බුදුසමයේ බාහිර ඉගැන්වීම් විකාශයට පැමිණි අයුරු

3. ශාසන ඉතිහාසය සම්බන්ධ තොරතුරු

4. ග්‍රන්ථාගත මතභේද

5. ලක්දිව සමාජ තොරතුරු

මෙයට අමතරව ව්‍යාකරණ පිළිබඳ දැනුම ද මේ තුළින් ලබාගත හැකිය. මේ අනුව, පාලි ටීකා ග්‍රන්ථයන් පරිශීලනය කිරීම බහුශ්‍රැතයකු වීම සඳහා අත්‍යවශ්‍ය කරුණකි. ඒ බව ටීකා පරිශීලනය කිරීමෙන් ම උගත හැකිය.